චක්‍රලේඛ අංක ..2010/18........

මගේ අංක/ඩබ්/05/2010
බන්ධනාගාර මූලස්ථානය,කොළඹ 09.
2010.05.10

සියලුම බන්ධනාගාර අධිකාරීන්/සහකාර අධිකාරීවරුන් වෙත

## සිරකරු පවුල් සුභ සාධනය සහිත පසුහාර ව්‍යාපෘතිය

උක්ත කරුණට අදාලව මවිසින් නිකුත් කරන ලද 12/2007 දරණ 2007.03.01 හා 13/2009 දරණ 2009.02.18 දිනැති චක්‍රලේඛ හා බැදේ.

බන්ධනාගාර දෙපාර්තමේන්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමග ඒකාබද්ධව ක්‍රියාත්මක කරණු ලබන සිරකරු පවුල් සුබසාධනය සහිත පසුහාර ව්‍යාපෘති කටයුතු "මහින්ද චින්තන" වැඩ පිළිවෙලට සමගාමීව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ රැසක සාර්ථකව ක්‍රියාත්මක කර ඇත.

සිරගතවූවන්ගේ පවුල්වල සුභ සාධනයට මෙන්ම බන්ධනාගාරයෙන් නිදහස්ව යන පුද්ගලයින්ගේ පසුහාරකාරිත්වය සදහා මෙම වැඩ පිළිවෙල අතිශයින් ඵලදායී වන බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සෘජු මැදිහත්වීම මත සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කරමි. මෙකී ක්ෂේත්‍රයේ කටයුතු කිරීම සම්බන්ධව සුභ සාධක නිළධාරීන්ට වැඩමුළුවක් මගින් අවශ්‍ය පුහුණුවක්ද ලබාදී ඇති බැවින් පහත සදහන් පරිදි කටයුතු කරන ලෙස දන්වමි.

01.. දිවයිනේ සියළුම සුභ සාධක නිළධාරීන් සදහා පොලිස් කොට්ඨාශ අනුව ක්ෂේත්‍ර බලප්‍රදේශ වෙන්කර දී ඇති අතර, ඔවුන් අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යවා සිරකරු පවුල් සුභසාධනය සහිත පසුහාර කමිටු පිහිටුවීමට කටයුතු කර ඒ පිළිබඳව විස්තර මා වෙත වාර්තා කල යුතුය..

02. I.. ඉහත චක්‍රලේඛ වලින් දී ඇති උපදෙස් ප්‍රකාර ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලට යොමු කිරීමට සකස් කරන අයදුම්පත් (I . 11) සුභ සාධක නිළධාරී විසින් සිරකරු සම්මුඛ පරීක්ෂණයට භාජනය කර මනා ප්‍රමිතියකින් යුතුව පිරවිය යුතුය. බලපත්‍ර මත නිදහස් වීමට නියමිත සිරකරුවන් හා 9 වන වගන්තිය යටතේ මුදවා හැරීමට නියමිත තරුණ වරදකරුවන් සදහා පුරවන අයදුම්පත්හි එක් පිටපතක් අදාල බලපත්‍රධාරී ගොණුවට ඇතුලත් කල යුතුයි.

II..බපත්‍රධාරීන් සම්බන්ධව සුභ සාධක නිළධාරී සපයන ත්‍රෛමාසික ප්‍රගති වාර්ථාවල මෙකී ආධාර ලබා ගැනීම, එම වෘත්තිමය ආධාර මත ඔවුන් ලත් ප්‍රගතිය පිළිබඳව විස්තරද සදහන් කල යුතුය. බලපත්‍රධාරීන්ගේ සමාජ වාර්තා ගොනුවල ප්‍රතිකාර ඉලක්කයක් ලෙස මෙකී ආධාර මත ඔවුන්ගේ පුනරුත්ථාපනය සදහා සකස් කරණ වැඩ පිළිවෙල පිළිබඳවද තොරතුරු සදහන් කර එවීමට කටයුතු කල යුතුය.

III..ප්‍රධාන සුභසාධක නිළධාරී, ජ්‍යෙෂ්ඨ සහ සාධක නිළධාරී ආයතන සහ බලපත්‍රධාරීන්ගේ අධීක්ෂණ කටයුතු කිරීමේදී මෙම ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳව පූර්ණ තොරතුරු සපයන වාර්තාවන්හි ඇතුලත් කල යුතුය. මේ පිළිබඳ සටහන් සමාජ වාර්තා ගොනුවලද තැබිය යුතුය.

IV. ප්‍රදේශීය ලේකම් විසින් කමිටු රැස්වීම් සදහා කරනු ලබන දැන්වීම් අනුව සුභ සාධක නිළධාරීන් ඊට සහභාගි කරවීමට බන්ධනාගාර අධිකාරීන් කටයුතු කල යුතු අතර, ක්ෂේත්‍ර රාජකාරි ගමන් වැඩසටහනට එම විස්තර ඇතුලත් කර ඉදිරිපත් කල යුතු අතර, රැස්වීමේදී ගන්නා ලද තීරණ හා ප්‍රගතිය පිළිබඳ විස්තර එම මාසය තුලදීම බන්ධනාගාර කොමසාරිස් (සුභසාධක) වෙත වාර්ථා කල යුතුය.

03. ඔබ ආයතනයට අනුයුක්ත සිරකරු සුභ සාධක සංගමයේ සාමාජිකයන් මෙම කමිටු රැස්වීම් සදහා සහභාගි කරවීම ඵලදායි බැවින් සංගමයේ රැස්වීම් වලදී ඒ සදහා අවශ්‍ය මග පෙන්වීම කර ප්‍රාදේශීය කමිටු ශක්තිමත් කර සිරකරුවන්ට එහි ප්‍රතිඵල ලබාගැනීමට වැඩපිළිවෙලක් සැලසුම් කර ඒ පිළිබඳ තොරතුරු මා වෙත හා සිරකරු සුභ සාධක සංගමයේ මධ්‍යම කමිටුව වෙතද වාර්තා කල යුතුයි.

04. මෙම ව්‍යාපෘතියට අදාලව සුභ සාධක නිළධාරීන්ගේ කාර්ය්‍ය භාරය නිසි පරිදි ඉටුවේද යන්න සොයා බලා අවශ්‍ය මග පෙන්වීම හා උපදෙස් එම නිළධාරීන්ට ලබාදීමත් මෙකී කටයුතු සාර්ථක කර ගැනීමට අවශ්‍ය අධීක්ෂණයන් බන්ධනාගාර අධිකාරීන් විසින් කල යුතුය.

වී.ආර්.සිල්වා. ආර්එස්පී යූඑස්පී එන්ඩියූ අයිපී
මේජර් ජනරාල්
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්